ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය
ඩුබායි
2014 අප්‍රේල් 28

**සිංහල අලුත් අවුරුදු උළෙල - 2014**

අප දහම් පාසලේ දරුවන් උදෙසා පැවැත්වෙන අලුත් අවුරුදු උළෙල අප්‍රේල් මස 11 වැනිදා සිකුරාදා පෙ ව 8.00 සිට ඩුබායිහි ලතීෆා (අල් වාසල් ) ක්‍රීඩාංගණයෙහි පැවැත්වෙන බව කරුණාවෙන් දැනුම් දෙමු.

අවුරුදු නැකත් සහ සිරිත් විරිත් නාට්‍යානුසාරයෙන් දරුවන් හට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අවුරුදු ජන ක්‍රීඩා සහ තරඟ ආරම්භ වනු ඇත. මෙම අවස්ථාවන් හට සහභාගී වීම දහම් පාසලේ දරු දැරියනට පමණක් සීමා වනු ඇත. එක්සත් අරාබි එමීරයේ වෙසෙන අවුරුදු 16 ට අඩු ශ්‍රී ලාංකික දරු දැරියන් හට, අවුරුදු කුමරා සහ අවුරුදු කුමරිය තේරීම තරඟ සඳහා සහභාගී විය හැක.

එදින ක්‍රීඩාංගනයට පැමිණෙන ඔබගේ පිරිමි දරුවන් බතික් හෝ පාට කමිසයකින් සහ සරමකින් ද ගැහැණු දැරියන් බතික් හෝ පාට රෙද්දකින් සහ හැට්ටයකින් සැරසී සිටීම අත්‍යවශ්‍ය බව ඉතා කරුණාවෙන් දන්වා සිටිමු. අවුරුදු චාරිත්‍ර වැඩසටහනට පසුව තරඟ වලට ඉදිරිපත් වීම සඳහා සුදුසු ඇඳුමකින් සැරසිය හැක.

තරඟ වලට සහභාගී වන සියලුම දහම් පාසල් දරු දැරියනට ත්‍යාගයක් ලබා දීමට සංවිධායක මණ්ඩලය කටයුතු යොදා ඇත.

අප්‍රේල් මස 11 වැනි දින උදෑසන 8.00 ට පෙර ක්‍රීඩාංගනය වෙත පැමිණ දරුවන් ලියාපදිංචි කරවන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි,

සංවිධායක මණ්ඩලය

1314-37